**ජාතික ශිල්ප සභාව - 2014**

**-------------------------------**

ජාතික ශිල්ප සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභාව අනුබද්ධිත පනතේ 84(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික ශිල්ප සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

වත්කමක් ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට පත් වූ අවස්ථාවේ සිට ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්‍රමානුකූල පදනමකින් එම වත්කම ක්ෂය කල යුතු නමුත් රු.718,228 ක් වටිනා පුස්තකාල පොත් සම්බන්ධයෙන් වූ ක්ෂය ප්‍රතිපත්තිය නිශ්චය කර නොතිබුණි.

#### 2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති අංක 07

වත්කම් සෑම වසර තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකමට දැක්විය යුතු වුවත් එසේ දක්වා නොතිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රදානයන් යටතේ මිලදී ගෙන තිබූ ජංගම නොවන වත්කම් වාර්ෂිකව ක්ෂය කර තිබූ නමුත් එයට අදාල ක්‍රමක්ෂය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ රාජ්‍ය ප්‍රදාන ශේෂය රු.95,047,571 ක් වූ අතර එය නියෝජනය වූ ජංගම නොවන වත්කම්වල ශුද්ධ වටිනාකම රු.61,575,322 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු හිඟ විගණන ගාස්තුව රු. 1,593,605 ක් විය.

(ඇ) කෙරීගෙන යන වැඩ ලෙස දැක්විය යුතු රු.4,171,985 ක් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ඈ) අභ්‍යන්තර මුදල් මාරු කිරීමේ සටහන් නිවැරදිව ගිණුම් ගත නොකිරීම නිසා ශිල්ප අරමුදල් ගිණුම රු.1,100,000 ක් අඩුවෙන්ද ගෙවිය යුතු මුදල් එම ප්‍රමාණයෙන්ම වැඩියෙන් ද දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ රේඛීය අමාත්‍යාංශයෙන් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ලැබුණු රු. 4,161,485 ක් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට වෙනත් ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

#### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් ගිණුම් 07 කට අදාල වත්කම් ලේඛන උපලේඛන සමඟ සැසඳීමේ දී රු.2,022,607 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු.404,469 ක් වූ බැරකම් සහ එකතුව රු.11,388,580 ක් වූ අමුද්‍රව්‍ය සහ ප්‍රදර්ශනාගාර තොග සඳහා ශේෂ සනාථ කිරීම් හා තොග සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i. මුදල් රෙගුලාසි 371( ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.1,107,311 ක් වූ අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර එයින් රු.232,675ක් වර්ෂ 02 කට වඩා පැරණි ශේෂයන්ගෙන් සමන්විත වී තිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 387 | බැංකු ගිණුමකින් අයිරා ගැනීම තහනම් වුව ද සභාවේ බැංකු ගිණුමක වර්ෂය පුරාම අයිරා ශේෂයක් පැවතුණි. |
| iii. මුදල් රෙගුලාසි 396(ඇ) | බැංකු ගිණුම් තුනක නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ඉක්ම වූ එකතුව රු.47,923 ක චෙක්පත් 13 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි / 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, සභාවේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.4,035,820 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.30,791,896 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු.26,756,076 ක වර්ධනයක් දක්නට ලැබුණු අතර සභාවේ මුළු ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 46 කින් ඉහළ යාම මෙම වර්ධනයට ප්‍රධාන වශයන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සීගිරිය ශිල්ප ගම්මානයේ කුලියට දී ඇති කුටිවලින් 2014 දෙසැම්බර් 09 දිනට අයවිය යුතු හිඟ ගාස්තුව රු.143,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට බැංකු සැසඳුම් ප්‍රකාශනයෙහි දැක්වෙන රු.2,627,489 ක බැර ශේෂ හා රු.152,252 ක හර ශේෂ, හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ජාතික ශිල්ප සභාව විසින් "අපේ ගම" තුළ වාර්ෂිකව පවත්වනු ලබන ශිල්ප ප්‍රදර්ශණ වලින් ජයග්‍රහණය කරන ලද විශිෂ්ඨ කලා නිර්මාණවලින් යුත් ශිල්ප කෞතුකාගාරයක් "අපේ ගම" තුළ පිහිටුවා ඇති අතර, එහි නඩත්තු කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.659,072 ක් වැය කර තිබූ නමුත් එම මුදල හස්ත කර්මාන්ත මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

නාගරික සංවර්ධන අධිකාරිය විසින් 99 අවුරුදු බදු පදනම මත ජාතික ශිල්ප සභාවට පවරා ඇති ඉඩමෙහි පිහිටි ගොඩනැගිලි 2013 වර්ෂයෙහි පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව සඳහා වූ ඉදිකිරීම් කමිටු තීරණය පරිදි කඩා ඉවත් කර තිබුණි. ඒ සමඟම ජාතික ශිල්ප සභාවට යාබදව ඉදිකර තිබූ ලක්සල ප්‍රදර්ශනාගාරය කඩා ඉවත් කර සභාව සතු භූමියෙන්ද අඩි 60 ක් පමණ ඇතුල්වන ලෙස නැවත ඉදිකර ඇති "අපේ ගම" ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය මඟින් පාලනය වන බැවින් මෙම ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් මතභේදාත්මක තත්ත්වයක් ඇති වී තිබුණත් එය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

ග්‍රාමීය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ආරම්භ කරන ලද අක්කර 03 කින් සමන්විත සීගිරිය ශිල්ප ගම්මානය වර්තමානයේ ගොඩනැගිලි 04 කින් හා අළෙවි කුටි 40 කින් සමන්විත වුව ද ප්‍රයෝජනයට ගනු ලබන්නේ එක් ගොඩනැගිල්ලක් හා අළෙවි කුටි 09 ක් පමණි. ලක්සල සඳහා ලබා දී තිබූ ගොඩනැගිල්ල, දේශන ශාලාව, ආපන ශාලාව, වැසිකිළි සංකීර්ණය ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවති අතර පාවිච්චි කිරීමට ජලය නොමැතිවීම, සංචාරකයන් නොපැමිණීම නිසා ශිල්පීන්ගේ ආදායම් අඩුවීම ගම්මානය පවත්වාගෙන යාම අපහසු වීම කෙරෙහි ප්‍රධාන වශයෙන්ම බලපා තිබුණි.

### 4.4 හඳුනාගන්නා ලද පාඩු

ජාතික ශිල්ප සභා ප්‍රදර්ශනාගාරය විධිමත් කිරීම හා අභ්‍යන්තර අලංකරණය සඳහා 2012 වර්ෂයේ දී රු.1,431,316 ක් වැය කර ඉදිකළ ගොඩනැගිල්ල සහ ශිල්ප සභා භූමියේ ශිල්ප ගම්මානයට පිවිසීම සඳහා රු.1,152,902 ක් වැය කර ඉදිකරන ලද දැව පාලම විවෘත කිරීමටත් පෙර වෙනත් සංවර්ධන කටයුත්තක් සඳහා කඩා ඉවත් කර තිබීම හේතුවෙන් රු. 2,584,218 ක පාඩුවක් සිදුවී තිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

ජාතික ශිල්ප සභාවේ 2014 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 262 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 254 ක් විය. අනුමත කාර්ය මණ්ඩලයේ 15 ක පුරප්පාඩු සහ ප්‍රාථමික නුපුහුණු මට්ටමේ 18 ක අතිරික්තයක් විය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 වර්ෂයට අදාළව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, එහි සමහර අංශවල අරමුණු සපුරා ගැනීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

2014 වර්ෂයට අදාල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත්ව තිබූ ප්‍රධාන වැඩසටහන් වූ හස්ත කර්මාන්ත ගම්මාන වැඩසටහන හා හස්ත කර්මාන්ත කෞතුකාගාරය ජනතාව අතර ජනප්‍රිය කිරීම යන අරමුණු සපුරා ගැනීමට කළමණාකරනය අපොහොසත් වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුල පුහුණුවන්නන් සඳහා උපකරණ කට්ටල 750 ක් ලබා දීමට සැලසුම් කර තිබුණද එයින් 200 ක් පමණක් ලබා දී තිබුණු අතර ක්‍රියාකාරී උප වැඩසටහන් 28 අතුරින් උප වැඩසටහන් තුනක ඉලක්ක සපුරා ගැනීමට අපොහොසත් වී තිබුණි.

**5.2 නොවිසඳී ඇති විගණන ඡේද**

2009 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය යටතේ දිවයින පුරා පිහිටි ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන, එහි දේපල සහ සේවකයින් ජාතික ශිල්ප සභාව වෙත පවරා තිබූ නමුත් දේපල නීත්‍යානුකූලව පැවරීමක් සිදුවී නොතිබුණි. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ ගිණුම් අනුව මධ්‍යස්ථානවලට අයත් රු. මිලියන 46 ක් වූ වත්කම් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජාතික ශිල්ප සභාවේ වත්කම් ලෙස ගිණුම් ගතකර නොතිබුණි. මෙයට ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට පවරන ලද වාහන තුනක්ද ඇතුලත්ව තිබුණි. මධ්‍යස්ථානවල ඇති ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණය සඳහා විශාල මුදලක් වැය කර තිබුණද එම මධ්‍යස්ථානවල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**5.2 පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානය වෙත යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම් පාලනය.
(ආ) අත්තිකාරම් පාලනය.
(ඇ) ගිණුම්කරණය.
(ඈ) ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන පරිපාලනය.